5

# උඩරට වෙස් ඇඳුමේ ප්‍රභවය සහ සූර්ය සංකල්පය

*ටී. එම්. ක්‍රිෂාන්ති ලක්මාලි තෙන්නකෝන්* [1]
HU /2012/0758

උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධානතම නළු ඇඳුම් කට්ටලය වන්නේ වෙස් ඇඳුම් කට්ටලය යි. මෙකී ඇඳුම් කටට්ලයෙහි ප්‍රභවය සහ එහි විවිධ පැළඳුම්, ආභරණ සහ අලංකරණ අංග පිළිබඳ විවිධ මතවාද ඇති ඇතර ඒ කෙරෙහි සූර්ය දෙවි සංකල්පයෙහි බලපෑමක් ඇතැයි යන්න ප්‍රබල ලෙස ස්ථාපිතය. මෙම පර්යේෂණයේ මූලික අරමුණ වන්නේ එම මතයෙහි යුක්ති යුක්ත බව අධ්‍යයනය කිරීමයි. සාහිත්‍යයික මූලාශ්‍ර, උඩරට නර්තනය පිළිබඳ සිදුකර ඇති පර්යේෂණාත්මක ග්‍රන්ථ, මහා නර්තන සංගායනා එනම් ශ්‍රව්‍ය දෘශ්‍ය මූලාශ්‍ර ද මෙම පර්යේෂණ ක්‍රමවේදය සඳහා භාවිත කරනු ලැබේ. වෙස් ඇඳුමේ එක් එක් කොටස් නිර්මාණය කිරීමේ දී විශේෂයෙන් පායිම්පත, අවුල්හැරය වැනි ඇඳුම් කොටස් මෙන් ම, ශිඛා බන්ධනය, සිලම්බු ආදී පැළඳුම් කොටස් සඳහා ද සූර්යාගේ කිරණ අනුකරණය කොට ඇති අතරම සූර්යාගේ ක්‍රියාකාරීත්වය නැතහොත් සූර්යයාගේ ස්වරූපය විදහාපාන අංගෝපාංග සියල්ලක් ම පාහේ වෙස් ඇඳුම් කට්ටලය නිර්මාණය වීමට බලපා ඇති බව මානව සහ සමාජ විද්‍යාත්මක පදනමකින් විමසීමේ දී පැහැදිලි වේ.

ප්‍රමුඛ පදඃ වෙස් ඇඳුම් කට්ටලය, සූර්ය සංකල්පය, උඩරට නර්තන සම්ප්‍රදාය

*1 ප්‍රාසංගික කලා (විශේෂවේදී) තෙවන වසර*